17

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2016-07-27

පැමිණිලිකරුවන් : 01. දිපිකා දර්ශනී මිල්ලනිය මිය.
නො : 31, කොට්ටාව පාර, මිරිස්වත්ත,
පිලියන්දල

02. එච්.එම්.මල්ලිකා මිය
නො : 131/ඩී, පහල බියන්විල,
කඩවත.

වගඋත්තරකරුවන් : 01. සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
නො : 574, ගාලුපාර,
කොළඹ 03

02. අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
නො : 574, ගාලුපාර,
කොළඹ 03

<u>පැමිණිලි අංක : HRC/3405/14</u>

පැමිණිල්ල තුළින් දක්වා ඇති කරුණු :-

මෙම පැමිණිල්ල මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව හිමිවිය යුතු උසස්වීම් අහිමිකර තිබීම සම්බන්ධව දක්වා ඇති අතර, හිමිවිය යුතු උසස්වීම් සමග අදාළ වැටුප්ද හිග වැටුප් ද ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත.

2011.11.01 දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සියලුම සේවක ශ්‍රේණි සඳහා නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව නිර්දේශය ලබා දී ඇති බවද ඒ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අනුව ලිපිකාර හා සාමාන්තර සේවාවන්හි සේවයේ යෙදුන තාක්ෂණික නොවන සියලුම සේවකයින් 2012.06.01 දින සිට කළමණාකරණ සහකාර තාක්ෂණික නම් නොවන සේවා ගණයට අන්තර්ග්‍රහනය කර 2006 වැටුප් චක්‍රලේඛනයේ MA-1-1 යන වැටුප් පරිමානය ලබාදී ඇති බවද දක්වා ඇත. පෙත්සම්කරුවන් එම සේවා ගණයට අයත් බවද අනුමත සේවක සංඛ්‍යාව 95 ක් බවද පෙන්වා දී ඇති අතර නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව ශ්‍රේණි 1, 2, 3 ලෙස තිබී ඇති ඇතත් 1 ශ්‍රේණියෙන් ඔබ්බට උස්සවීමට අවස්ථාවක් නොලැබීම මින් පෙන්වා දෙන අසාධාරණය බවද සඳහන් කර ඇත.

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2009.09.24 වන දින දක්වා ඇති පරිදි තේ මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කළ යුත්තේ ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශිත ආකෘතිය අනුව බවද සඳහන් කර ඇත. එම ආකෘතියට අනුව කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය සහ කළමණාකරණ සහකාර අධි පන්තිය ශ්‍රේණි දෙකක් යටතේ වන අතර මෙම ක්‍රම දෙක පෙත්සම්කරුවන් හට හිමි උසස්වීම් ක්‍රමයක් ලෙස සැළකිය හැකි නමුත් බඳවා ගැනිමේ පටිපාටියේ එය හඳුන්වා දිය නොහැකි බව පෙන්වා දි ඇත. නමුත් මෙම ක්‍රමවේදය අනුගමනය නොකර තිබිම සම්බන්ධව පෙන්වා දුන්නද නොසලකාහැර තිබීම පැමිණිලි පාර්ශවයට සිදුවූ අසාධාරණයක් බවද උසස්වීම් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමිකර ඇති බවද පෙන්වා දි ඇත.

ඒ අනුව 2006.01.01 දිනට පසුව කිසිදු උසස්වීමක් නොලද මෙම තනතුරේ සිටින I ශ්‍රේණියේ වර්ෂ 10 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් එම වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කළ දින සිට බලපැවැත්වෙන පරිදි කළමණාකරණ සහකාර අධි පන්තිය යන සේවා ගණයට ඇතුළත් කර ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙසට පැමිණිල්ලෙන් දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

2014.09.03 දින වගඋත්තරකරු වෙත මෙම පෙත්මට අදාළ කරුණු දක්වා වාර්තාවක් ලාබදීමට දන්වා ඇතත් එය ලබාදී නොතිබීමේ හේතුව මත 2014.09.30 දින පරික්ෂණය සඳහා ඉදිරිපත්වන ලෙස සිතාසි ප්‍රකාරව දන්වා ඇත. එහිදී වගඋත්තරකරුවන් ඉදිරිපත්ව නොතිබීමේ හේතුව මත නැවත පරික්ෂණ සඳහා 2015.05.11 දින දෙපාර්ශවයේ සිතාසි ප්‍රකාරව ඉදිරිපත්වීමට කරන ලද දැන්වීමට අනුව ඉදිරිපත්ව පරික්ෂණය සඳහා ඉදිරිපත්ව කරුණු දක්වා ඇත.

එහිදී පැමිණිලිකරුවන් වැඩිදුරටත් සිය කරුණු ඉදිරිපත් කර ඇති අතර වගඋත්තරකරුවන් වෙනුවෙන් ඉදිරිපත් වූ සහකාර අධ්‍යක්ෂ එල්.එස්.පී. ද සිල්වා මහතා සඳහන් කර ඇත්තේ පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම ඉටු කිරිම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමණාකාරිත්වයේ අකමැත්තක් නොමැති බවද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් 2013.07.13 වන දින

මුදල් අමාත්‍යාංශය යටතේ පවතින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මේ පිළිබඳව විධිමත්ව කරුණු දක්වා යවා ඇතත් පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බව දන්වා එවා ඇති බවයි.

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉදිරිපත්ව සිටි පර්යේෂණ නිලධාරි එස්.එම්.එම්.ඩී. සමරවීර මහතා මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ මෙම ගැටලුවේ පවතින ස්වභාවය සැලකිල්ලට ගෙන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත කරුණු යොමු කර නැවත සලකා බැලීමට පියවර ගන්නා ලෙසයි. කොමිෂන් සභාව විසින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ලිඛිත වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවද ඔහු විසින් යෝජනා කර ඇත.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට පැමිණ සිටින නීති නිලධාරිනී ජී.ජ්.සී.ඩී බණ්ඩාර මහත්මිය ප්‍රකාශ කර ඇත්තේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කරනු ලබන යෝජනාවට ඔවුන් විසින් විරෝධතාවයක් නොදක්වන බවයි.

2015.07.27 දින පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමේදිද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා තේ මණ්ඩලය විසින් පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම සම්බන්ධයෙන් අදාළ සහනය ලබාදීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දෙන්නේ නම් එයට අනුව කටයුතු කිරීමට විරෝධතාවයක් නොදක්වන බවට වගඋත්තර පාර්ශවයන් විසින් දන්වා තිබීම මත කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව පමණක් ගෙන්වා කරුණු විමසීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

2015.09.10 වන දින පරීක්ෂණය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සිතාසි නිකුත් කළ පසුව ඒ වෙනුවෙන් නියෝජනය කිරීමට මින් පෙර මෙම පරීක්ෂණයට ඉදිරිපත් වූ පර්යේෂණ සහකාර ඩී.එම්. සරත් මහතා කරුණු දක්වා ඇත.

පෙත්සම්කරුවන් වෙනුවෙන් නීතිඥ ඒ.ඒ. වික්‍රමසිංහ මහතා ඉදිරිපත්ව ඇති අතර පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම පිළිබඳ වැඩිදුර කරුණු දක්වා සඳහන් කර ඇත්තේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය පැමිණිලිකරුවන්ගේ තනතුර වන කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ධූරයට අදාළව දැනට පෙන්වා දෙන පරිදි I ශ්‍රේණියෙන් පසු උසස්වීම් ලබා ගැනීමට හැකියාවක් නොමැතිවීම පිළිබඳවය. එහිදී විශ්‍රාම ගන්නා තුරුම I ශ්‍රේණියේ වසර 10 කට වඩා සේවය කරමින් සිටින පැමිණිලිකරුවන් වෙනුවෙන් සුදුසු සාධාරණ උසස්වීම් ක්‍රමයක් ඉල්ලා සිට ඇත.

මේ සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ කළමණාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ තනතුර දරණ අයෙකුට ජ්‍යෙෂ්ඨ කළමණාකරු තනතුරට ඇතුල්වීමේ අවස්ථාව නව බඳවා ගැනීමේ පටිපාටිය තුළින් සකස් කර ඇති බවයි. තවද කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන යන සේවා ගණය සහිත මෙම පැමිණිලිකරුවන්ට කණිෂ්ඨ කළමණාකරණ සේවාවට අයත් තනතුරු 24 කින් යුත් තනතුරු සඳහා උසස්වීම් ලද හැකිවන පරිදි අවස්ථාව සලසා ඇති බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරුවන් සඳහන් කර ඇත්තේ කළමණාකරණ සහකාර තාක්ෂණික තනතුර දරණ අය විසින්ද මෙයට සමානව ඇති වූ ගැටලුවකදී ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනු කළ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධව නඩුවක් වූ SCFR 553/11 නඩුවෙහිදී තීරණය කර ඇත්තේ 2013.03.04 වන දින සිට එකී තනතුරුවලට අදාළව තිබූ උස්සවීම් පටිපාටියක් නොතිබීම වෙනස් කළ යුතු බවද තනතුරු නාම පවා වෙනස් කළ බවද වේ. ඒ සම්බන්ධයෙන් වගඋත්රකරුවන්ගේ වැඩිදුර කරුණු දැක්වීම සිදුව නොමැත.

තිරීක්ෂණ :-

ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අනුමත කරන ලද නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව කළමණාකරන සහකාර තාක්ෂණික නොව සේවා ගණයට ඇත්තේ ශ්‍රේණි 03 කි. එනම් I, II, III ශ්‍රේණි වේ. I ශ්‍රේණියෙන් ඔබ්බට වසර 15 ක් යනතුරු සාධාරණ උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දී නොමැති බව තිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් කියා සිටින කරුණු අනුව කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක : 30 අනුව අනුමත නව බඳවා ගැනීමේ පටිපාටියේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන යන සේවා ගණය සහිත මෙම පැමිණිලිකරුවන්ට කණිෂ්ඨ කළමණාකරණ සේවාවට අයත් තනතුරු 24කින් යුත් තනතුරු සඳහා උසස්වීම් ලද හැකිවන පරිදි අවස්ථාව සලසා ඇති බවට දන්වා ඇත. එහෙත් එම තනතුරු 24න් 20 ක්ම මෙම පෙත්සම්කරුවන්ට ඉල්ලුම්කර ලබා ගත හැකි උස්සවීම් නොවන බව තිරීක්ෂණය වේ. එයට හේතුව වන්නේ අභ්‍යන්තර සේවකයින්ට සේවා පළපුරුද්ද අනුව අඩු අධ්‍යාපන සුදුසුකමක් සඳහන් නොවන නිසා ඒ සඳහා ඉල්ලුම් කිරීමට විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් තිබිය යුතුවීමයි.

වගඋත්තරකරුවන් පෙන්වා දෙනු ලබන පුරප්පාඩු 24න් තනතුරු 04 ක් සඳහා සේවා පළපුරුද්ද මත පෙත්සම්කරුවන්ගේ සේවා ගණයේ වර්ෂ 05 ක් සම්පූර්ණ වූ සේවකයින්ට අභ්‍යන්තරව අයදුම් කළ හැකි වුවද මෑතකදී පුරප්පාඩු වූ පරිපාලන නිලධාරි, සැපයුම් නිලධාරි යන තනතුරු

සඳහා ඉහත සුදුසුකම් හා පළපුරුද්ද ඇති බොහෝ දෙනෙක් ඉල්ලුම් කළද ඔවුන්ගෙන් එක් අයෙකු හෝ තෝරා නොගෙන එම තනතුරු බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවා ඇති බව පැමිණිලිකරුවන් පෙන්වා දී තිබීම මත පෙනී යන්නේ පෙත්සම්කරුවන්ට ඒ සඳහා ඇති අවස්ථාව අහිමිවී ඇති බවය.

බඳවා ගැනීමේ පටිපාටිය සකස් කළ යුතු වන්නේ වැටුප් කොමිෂන් සභාවේ ආකෘති මත බවට වගඋත්තරකරුවන් වෙත කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දී ඇති බවද නිරීක්ෂණය වේ. බඳවා ගැනීමේ පටිපාටියට අදාළව අනිවාර්ය තොරතුරු ඇතුළත් එම නිර්දේශිත ආකෘති පත්‍රයෙහි උසස්වීම් සම්බන්ධව කළමණාකරණ සහකාර අධි පන්තිය දක්වා ඇතත් එය ඇතුළත් කර නොතිබීම මත පැමිණිලිකරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. තේ මණ්ඩලයේ සේවක සංගම් විසින් මේ සම්බන්ධව වගඋත්තරකරුවන්ට කරුණු දක්වා ඇතත් එම බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට පෙර ඒ වෙත අවධානය යොමු නොකිරීමෙන් පැමිණිලිකරුවන්ට මෙම ආසධාරණය සිදුව ඇත. පැමිණිලිකරුවන් I ශ්‍රේණියට පත්ව වසර 15 ක් පමණ සේවය කරමින් සිටියද උසස්වීමක් සඳහා අයිතිවාසිකම වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපයන් හේතු කොට ගෙන අහිමිවී ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

මෙම පැමිණිලිකරුවන් කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණය යටතේ මෙම පැමිණිල්ල ගොනු කර ඇති අතර මෙවැනි ආකාරයට අසධාරණයට ලක්වූ කළමණාකරණ තාක්ෂණික යන සේවා ගණය යටතේ සේවය කරන පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනු කරන ලද අංක : SCFR 553/11 දරණ නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ විසින් වගඋත්තරකරුවන් වෙත දක්වා ඇත්තේ මෙම සේවා ගණය යටතේ ඉල්ලීම සිදුකළ පැමිණිලිකරුවන්ට සිදුවී ඇති විෂමතාවය ඉවත් කිරීමට ගන්නා ලද තිරණයක් සම්බන්ධවයි. එහිදිද වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරින්ට අදාළ හිමිවිය යුතු උසස්වීම් ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතු බව පෙන්වා දී ඇත. පැමිණිලිකරුවන් සඳහන් කර ඇත්තේ කළමණාකරණ තාක්ෂණික නොවන ගණය යටතේ සිටින තමාගේද I ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් පිළිබඳව සලකා බලා පුද්ගලික වන සේ හෝ කළමණාකරණ සේවයේ සුදුසු වැටුප් පරිමානයකට අන්තර්ග්‍රහනය කර හිමිවිය යුතු වරප්‍රසාද ලබා දෙන ලෙසයි. එකී ඉල්ලීම පෙත්සම්කරුවන් I ශ්‍රේණියේ සේවය කර ඇති සේවා කාලය අනුව සලකා බැලීමේදී සාධාරණ ඉල්ලීමක් බවද වගඋත්තරකරුවන් විසින් නිසි අවස්ථාවේදී ඒ පිළිබඳව සොයා බලා කටයුතු කළ හැකිව තිබියදී කරන ලද නොසලකා හැරීමක් හේතුවෙන් ඇති වී තිබෙන කාරණාවක් බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නිගමනය :-

පැමිණිලිකරුවන් සේවය කරනු ලබන තනතුරු වල I වන ශ්‍රේණියේ වසර 10 කට වඩා වැඩි සේවා කාලයක් අඛණ්ඩව සේවය කර තිබීම පිළිබඳව සලකා බලා ඔවුන්ට හිමි උසස්වීම් ශ්‍රේණියක් ලබාදීම සඳහා වගඋත්තරකරුවන් අතර සාකච්ඡා තිබී ඇතත් ඒ පිළිබඳ තීරණයකට එළඹීමට කටයුතු කර නොතිබීම මත පැමිණිලිකරුවන්ට අසාධාරණයක් සිදුව ඇති බව පැහැදිලි වේ.

පැමිණිලිකරුවන් විසින්ද නිතර මේ පිළිබඳව කරන ලද ඉල්ලීම් නොසලකාහැර තිබීම මත පැමිණිලිකරුවන්ට සුදුසු උසස්වීම් ක්‍රමයක් අහිමිව ඇති අතර. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමණාකරණ සහකාර තාක්ෂණික යන සේවා ගණයට වසර 10 කට වඩා වැඩි සේවා කාලයක් සේවය කර තිබීම පිළිබඳව සලකා බලා සුදුසු උස්සවීම් ක්‍රමයක් නිර්දේශ කර නොතිබීම මත පැමිණිලිකරුවන් දැනට එකම තනතුරේ දීර්ඝ කාලයක් උසස්වීම් ලබා ගැනීමකින් තොරව සේවය කරන බවද අනාවරණය වී ඇත.

මෙකී කරුණු අනුව කළමණාකරණ තාක්ෂණික නොවන සේවා ගණය යටතේ I ශ්‍රේණියේ වසර 10 වඩා වැඩි කාලයක් සේවය කරමින් සිටින පැමිණිලිකරුවන් විසින් ඉල්ලා සිටින ලද ඉල්ලීම් පිළිබඳ සාධාරණව සලකා බලා සාධාරණ උසස්වීමේ ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව තුලින් සුරක්ෂිත කර ඇති නීතියේ සර්වසාධරනත්වය හා වෙනස්කමකට භාජනය කොට නොසැලකිය යුතු බවට වූ ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

එබැවින් පෙත්සම්කරුවන් එකම තනතුරේ වසර 10 කට වඩා වැඩි කාලයක් සේවය කර තිබීම පිළිබඳව සලකා බලා සාධාරණ උසස්වීම් ක්‍රමයක් පිළිබඳව වගඋත්තරකරුවන් විසින් තීරණය කොට පැමිණිලිකරුවන්ට සිදුව ඇති අසාධාරණය වැලැක්වීමට පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

2016.08.29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
**Chairperson**
Human Rights Commission of Sri La

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, (කළමණාකරණ සේවා)
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

B/lab1